1204

# කෝට්ටේ යුගයෙන් පසු ලක්දිව පාලි සාහිත්‍යයේ ප්‍රවණතා පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

RARE

වැලිවිට සෝරත හිමි.
FGS/04/02/06/2007/01

RECEIVED
11 JUL 2016
Faculty of Graduate Studies
University of Kelaniya

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ පාලි විෂය පිළිබඳ දර්ශනපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1204 |
| වර්ග අංකය: | |

2014 දෙසැම්බර්

# සාරසංක්ෂේපය

මෙම නිබන්ධයේ දී පර්යේෂණය කිරීමට අපේක්ෂා කළේ කෝට්ටේ යුගයෙන් පසු ලක්දිව පාලි සාහිත්‍ය ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයකි. දඹදෙණි යුගයෙන් පසු ලක්දිව ඇති වූ දේශපාලනික, ආගමික හා සාහිත්‍යයික බලපෑම් මත පාලි සාහිත්‍යයේ අවනතියක් දක්නට ලැබුණි. එහෙත් පශ්චාත්කාලීන උගතුන්ගේ ශාස්ත්‍රකාමී උනන්දුව නිසා එය නැවතත් උන්නතියට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස පාලි සාහිත්‍යය කෘති ලක්දිව පමණක් නොව දේශාන්තර වශයෙන් ද ව්‍යාප්ත වන්නට විය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වූයේ කෝට්ටේ යුගයෙන් පසු ලක්දිව පාලි සාහිත්‍යයේ මෙවැනි ප්‍රවණතාවක් ඇති වූයේ කෙසේද? ඒ සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය කෙබඳුද? සාහිත්‍යය කෘති රචනා කිරීමේ නියැලුණෝ කවරහුද? ඔවුන්ගේ කෘති මොනවාද? යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමය.

පර්යේෂණය සිදු කිරීමේ දී අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ අවශ්‍ය දත්ත සපයා ගැනීමේදී මූලික වශයෙන් තත්කාලීන ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කළෙමි. එමන්ම පසුකාලීන ඓතිහාසික, ආගමික හා සාහිත්‍යයික තොරතුරු ඇතුළත් කොට දෙස් විදෙස් උගතුන් විසින් රචනා කර ඇති ද්විතීයික මූලාශ්‍රය ද පරිශීලනය කළෙමි. එකී මූලාශ්‍රයවල ඇතුළත් කරුණු තුලනාත්මකව ගලපා විචාරාත්මකව කරුණු ඉදිරිපත් කළෙමි. එහිදී හමු වූ ඇතැම් කරුණු පිළිබඳ සම විෂමතා දක්නට ලැබුණු අතර ඒවා තහවුරු කිරීමේ දී ප්‍රාථමික මූලාශ්‍රය කෙරෙහි වැඩි අවධානය යොමු කොට කරුණු ඉදිරිපත් කර ඇත.

පරිච්ඡේද හයක් ඔස්සේ කරුණු ගවේෂණය කළ අතර, පළමු පරිච්ඡේදයේ දී සාකච්ඡාවට බඳුන් වූයේ කෝට්ටේ යුගයෙන් පසු ලක්දිව පැවති ඓතිහාසික තොරතුරු හා සාහිත්‍යයික වශයෙන් ඇති වූ බිඳවැටීමයි. දෙවන පරිච්ඡේදයේ දී පුරාතන හා මධ්‍යතන යුගවල පටන් පිළිවෙළින් ඇති වූ ආගමික, සාමාජික සාධක ගෙනහැර දැක්වේ. විශේෂයෙන් ම පාලි භාෂාව කෙරෙහි සිංහල, සංස්කෘත හා වෙනත් භාෂාවන්ගේ බලපෑම ද මෙහිදී ඉදිරිපත් කෙරේ.

තුන්වන පරිච්ඡේදයේ දී කෝට්ටේ යුගයෙන් පසු පාලි සාහිත්‍යයේ සංවර්ධනය වූ විවිධ සාහිත්‍යාංග පිළිබඳ හැඳින්වීමක් හා වර්තමාන ශාසනික හා සාහිත්‍යයික උන්නතිය උදෙසා ක්‍රියාකළ වැලිවිට ශ්‍රී සරණංකර මාහිමිපාණන් වහන්සේගේ සාහිත්‍ය සේවාව පිළිබඳ දීර්ඝව සාකච්ඡා කෙරේ. එසේ ම පශ්චාත්කාලීන ගිහි-පැවිදි උගතුන් හා ඔවුන්ගේ ශාස්ත්‍රීය සේවාව පිළිබඳ කරුණු ද අඩංගු වී ඇත. හතරවන පරිච්ඡේදයේ අන්තර්ගත වී ඇත්තේ ලක්දිව පාලි සාහිත්‍යයේ අඳුරු යුගයක් වූ අවස්ථාවේ එහි දියුණුවක් ලබා සිටි සියම් හා බුරුම වැසි භික්ෂූන් අතර හුවමාරු කරගත් සන්දේශවල අඩංගු ආගමික, සාමාජික තොරතුරු පිළිබඳ විමසීමකි. පස්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කෙරෙන්නේ මහනුවර යුගයේ පාලි සාහිත්‍යයේ සංවර්ධනයට හේතු වූ කරුණු පිළිබඳවය. හයවෙනි පරිච්ඡේදයේ දී සමාලෝචනය හා මෙම නිබන්ධයේ ඉදිරිපත් කළ කරුණුවලින් නිගමනය වන්නේ කුමන කරුණක් ද යන්න කියැවේ.


**ප්‍රමුඛ පද:-** සාහිත්‍යයික බලපෑම්, ප්‍රවණතා, ප්‍රාථමික මූලාශ්‍ර, පාලි සන්දේශ කාව්‍ය, විවිධ සාහිත්‍යාංග,

# Abstract

The aim of this research was to study the trends of Sri Lankan Pali literature after Kotte Era. After the Dambadeni Era, due to the political, religious and literary influences, there was a deterioration of Pali literature, but as a result of the literary enthusiastic scholars at later time, it developed again. On account of Pali literary texts became famous not only in Sri Lanka but also in overseas. Accordingly, the objective of this research was to examine as to how there was such development in Pali literature after Kotte Era, how it got the support of the government and what their books are.

When the research was done according to the topic, it was primarily necessary to pay special attention to the primary sources at that time. At the same time, secondary sources with historical, religious and literary information at later time were used. Facts of those were presented by comparing them. So, there were some similarities and dissimilarities with some facts found and special attention was paid to those primary sources when presenting facts.

The research was done and presented in six chapters. In the first chapter, historical and literary details remained after Kotte Era was presented in the first chapter. In the second chapter, religious and social factors that were developing from prehistoric to medieval eras were discussed. More especially, the influence to Pali Language from Sanskrit and other languages also presented.

In the third chapter, introduction to various literary works that emerged after Kotte Era, and the service of Ven. Welivita Sri Saranankara for the development of literature and modern dispensation were discussed broadly. In the same manner, some details regarding lay and clergy scholars who lived lately and their contribution to literature were included.

Fourth chapter was dedicated to present religious and social factors found in Message Poems that were exchanged Thai (Siam) and Burmise monks who lived in one gloomy era of Sri Lankan Pali literature. In the fifth chapter, the factors that affected for the development of Pali literature in Kandy Era were presented. In the sixth chapter, the summary and the conclusion of the presented factors were brought out.

Keywords:- Literary Influences, Trends, Primary Sources, Pali Massage Poems, Various Literary Texts.